ස.සේ.කො.චක්‍රලේඛ අංක 06/2024

මගේ අංකය : ස.සේ.කො.06/චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)
නව පළාත් සභා ගොඩනැගිල්ල,
දෙවන මහල, කුරුණෑගල.
2024.08.30

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති, සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරි/කළමනාකරු.

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම**

සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා සාමාජිකයින් පත් කිරීමේදී අංක: ස.සේ.කො. 05/2020(1) හා 2021.08.09 දිනැති චක්‍රලේඛයෙහි දක්වා ඇති පරිදි පහත සඳහන් නිලධාරී කාණ්ඩ අතුරින් නිලධාරීන් තෝරා පත් කළ යුතු අතර මාණ්ඩලික නිලධාරියකු එහි සභාපති ලෙස පත් කිරීම අනිවාර්යවේ.

i. අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියෙකු
ii. සමුපකාර සේවක කොමිෂන් සභා කාර්යාලයේ නිලධාරියෙකු
iii. සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු (සමිතිභාර පරීක්ෂකවරයා හැර මූලස්ථාන පරීක්ෂක හෝ දිස්ත්‍රික් නිලධාරියෙකු)
iv. අදාල සමිතියේ විධායක නිලධාරියෙකු
v. අදාල සමිතියේ ගරු සභාපති හෝ අධ්‍යක්ෂ මණ්ඩලය නම් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු
vi. සමිතිභාර සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි

02.TSL වැටුප් පරිමාණයේ හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයේ හෝ තනතුරු සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල සාමාජික සංඛ්‍යාව 05 ක් විය යුතු අතර SL වැටුප් පරිමාණයේ හෝ ඊට පහළ වැටුප් පරිමාණයේ තනතුරු සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ සඳහා අවම වශයෙන් සාමාජික සංඛ්‍යාව 03 ක් විය යුතුය. සෑම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් සඳහාම සමුපකාර සේවක කොමිෂන් සභා නිලධාරියෙකු හා සමිති භාර සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි/දෙපාර්තමේන්තු නිලධාරියකු ඇතුලත් කිරීම අනිවාර්යවේ.

03.මෙම චක්‍රලේඛය 2024.09.01 දින සිට ක්‍රියාත්මක වන අතර මීට පෙර සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම සඳහා විධිවිධාන නියම කරමින් නිකුත් කර ඇති අනෙකුත් සියලුම චක්‍රලේඛ අභිබවා මෙම චක්‍රලේඛය බලාත්මකවේ.

04.මෙම චක්‍රලේඛය වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේ එකඟතාවය ඇතිව නිකුත් කරනු ලැබේ.

වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

පිටපත්:

1. ලේකම්, සමුපකාර සංවර්ධන හා වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු,සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය(වයඹ) - කා.දැ.ස.

2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්(වයඹ) - කා.දැ.ස.

3. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, කුරුණෑගල/කුලියාපිටිය/හලාවත/මහව - කා.දැ.ස.

සමුපකාර සේවක කොමිෂන් සභාව- වයඹ පළාත
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு- வடமேல் மாகாணம்
Co-operative Employees Commission–North Western Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எமதுஇ / My No: ස.සේ.කො.06/චක්‍රලේඛ | ඔබේ අංකය / உமதுஇ / Your No: | දිනය / திகத / Date: 2024.10.15 |

වයඹ පළාතේ සියලුම සමූපකාර සමිති,සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු

**<u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව 2024.08.30 දිනැතිව නිකුත් කර ඇති ස.සේ.කො. චක්‍රලේඛ අංක 06/2024 හි 02 වන ඡේදයේ "සෑම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් සඳහාම සමූපකාර සේවක කොමිෂන් සභා නිලධාරියකු හා සමිතිභාර සමූපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි/දෙපාර්තමේන්තු නිලධාරියකු ඇතුලත් කිරීම අනිවාර්යවේ." ලෙස නියෝගයේ සඳහන් වුවද, මුද්‍රණ දෝෂයකින් "සමිතිභාර සමූපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි/දෙපාර්තමේන්තු නිලධාරියකු" යන්න ඇතුලත් වී නැත.

02. එබැවින් නිවැරදි කරන ලද චක්‍රලේඛය මේ සමඟ යොමු කරන අතර ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

එච්.එම්.පී.කේ.හේරත්,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව (වයඹ).

පිටපත්:

1. ලේකම්, සමූපකාර සංවර්ධන හා වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු,සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය(වයඹ) - කා.දැ.ස.

2. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්(වයඹ) - කා.දැ.ස.

3. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, කුරුණෑගල/කුලියාපිටිය/හලාවත/මහව - කා.දැ.ස.

h:\දිල්\චක්‍රලේඛ සං.ආවරණ ලිපියා\2024\.docx

නව පළාත් සභා සංකීර්ණය,දෙවන මහල,කුරුණෑගල. New Provincial Council Office Complex, second FloorKurunegala.

ලේකම් / செயலாளர் / Secretary: 037-2233853
කාර්යාල / அலுவலகம் / Office: 037-2228151